# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 670 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/04/2024 පැය 0530

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ඇඹිලිපිටිය පොලිස් වසම.

2024.04.18 වන දින රාත්‍රී කාලයේදී ඇඹිලිපිටිය පොලිස් වසමේ මඩුවන්වෙල ජනපද ප්‍රදේශයේ කුළී නිවසක පදිංචිව සිටි පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට ඇඹිලිපිටිය පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ කැල්ල, කොලොන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කුළී නිවසේ තනිව පදිංචිව සිටිමින් ඉදල් කොහු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇති අතර තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකල විමර්ශනයේදී නිරීක්ෂණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් පරීක්ෂණය සිදුකිරීමට නියමිත අතර ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - අරලගංවිල පොලිස් වසම.

2024.04.18 වන දින උදෑසන කාලයේ අරලගංවිල පොලිස් වසමේ පිඹුරත්තෑව වැවේ මුල්ගල තොටුපලේ පුද්ගල මෘත ශරීරයක් පාවෙන බවට අරලංවිල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වන මුල්ගල යාය 01 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.04.17 වන දින පිඹුරත්තෑව වැවට ධීවර කටයුතු සඳහා ගොස් ඇති අතර එහිදී තවත් පුද්ගලයෙකු හා එම පුද්ගලයාගේ බිරිද සමඟ මත්පැන් පානය කර ඇති බවත් එම අවස්ථාවේ ඇති වූ පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් ඔවුන් විසින් හබලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට අනාවරණය වී ඇත.

ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 67 ක් වූ සැකකරු හා වයස අවරුදු 47 ක් වූ සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇත. අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මනුෂ්‍ය ඝාතනයක් - රිදීගම පොලිස් වසම.

2024.04.18 වන දින උදෑසන කාලයේ රිදීගම පොලිස් වසමේ අම්බාගොඩ ප්‍රදේශයේ පොල් ඉඩමක්තුල පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට රිදීගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වන අම්බාගොඩ, මඩිතියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු රැකියාව ලෙස කුකුල් ගොවිපොලක් පවත්වාගෙන යන අතර 2024.03.17 වන දින රාත්‍රී කාලයේ මරණකරුට අයත් කුකුල් ගොවිපලේ කුකුලන් මිලදීගැනීමට පැමිණි පුද්ගලයෙකුගේ ලොරි රථයකට එම කුකුලන් පැටවීමෙන් පසු නිවසට පැමිණ ඇත. අනතුරුව ලොරි රථය කාණුවකට වැටි එරී ඇති බවට ලොරි රථ රියදුරු විසින් මරණකරුට දුරකථනයෙන් දැනුම්දීමෙන් පසු ඔහු බාප්පාද සමඟ එම ස්ථානයට ගොස් ඇත.

2024.04.18 වන දින නිවස අසල පොල් ඉඩමක තිබී ගෙල සිරකර ඝාතනය කල එම පුද්ලයාගේ මෘත ශරීරය හමුවී ඇත. පුද්ගලික ආරවුලක්මත මෙම ඝාතනය සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් වයස අවරුදු 32 හා වයස අවරුදු 56 ක් වූ රිදීගම ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. රිදීගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මත්කරල් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පුල්මුඩේ පොලිස් ස්ථානය.

2024.04.18 වන දින උදෑසන කාලයේදී පුල්මුඩේ පොලිස් වසමේ මුත්තන්කුලම වැව අසලදී පුල්මුඩේ පොලිස් ස්ථානයේ නිලධාරීන් හා පුල්මුඩේ පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් එක්ව සිදුකල වැටලීමකදී මත්කරල් 1229 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 26 යන වයස් වල පසුවන හමාස් නගර්, පුල්මුඩේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුල්මුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2024.04.18 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ නයිවල පාර ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 786 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2024.04.18 වන දින රාත්‍රී කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ හබරකඩ කනත්ත අසලදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.04.18 වන දින රාත්‍රී කාලයේ මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ඇපල්වත්ත ප්‍රදේශයේදී ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 120 ක් සන්තකයේ තබාගෙ සිට සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.04.18 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපල අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**ගල්කිස්ස පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.**

**09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සීදූව පොලිස් ස්ථානය.**

2024.04.18 වන දින සීදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කටුනායක ප්‍රදේශයේදී ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් කටුනායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී පා පැදියක් සොරකම් කිරීම, ත්‍රිරෝද රථයක බැටරි දෙකක් සොරකම් කිරීම, ජංගම දුරකථයක් සොරකම් කිරීම යන අපරාධ සිදුකර ඇති බවට අනාවරණය කරගෙන ඇති අතර, සැකකරුගේ මඟපෙන්වීම මත එම දේපල සොයාගෙන ඇත. සීදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. දියේ ගිලී මියයාමක් - නෝර්ටන්බ්‍රිජ් පොලිස් වසම.

2024.04.18 වන දින සවස් කාලයේදී නෝර්ටන්බ්‍රිජ් පොලිස් වසමේ කාසල්රි ජලාශයේ දිය නාමින් සිටි තරුණයෙකු ගිලී මියගොස් ඇති බවට නෝර්ටන්බ්‍රිජ් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ කාසල්රි කොටස, හැටන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු යහළුවෙකු සමඟ ඉහත ජලාශයේ දියනාමින් සිටියදී මෙලෙස අනතුරට පත්ව ඇති බව සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. හදිසි මරණ පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය ග්ලැන්කන් මූලික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නෝර්ටන්බ්‍රිජ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. දියේ ගිලී මියයාමක් - ලුණුගල පොලිස් වසම.

2024.04.18 වන දින දහවල් කාලයේදී ලුණුගල පොලිස් වසමේ හොප්ටන් ප්‍රදේශයේ හැටේවල යන ස්ථානයේ දිය නෑමට ගිය ළමුන් පිරිසක් අතරින් එක් ළමයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට ලුණුගල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ හොප්ටන්, ලුණුගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය හොප්ටන් මූලික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ලුණුගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. විදේශ ජාතිකයෙකු දියේ ගිලී අතුරුදහන්වීම - අහුංගල්ල පොලිස් වසම.

2024.04.18 වන දින උදෑසන කාලයේ අහුංගල්ල පොලිස් වසමේ සංචාරක හෝටලයක් පිටුපස මුහුදු තීරයේ දිය නාමින් සිටි විදේශ ජාතික පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට අහුංගල්ල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස අතුරුදහන්වී ඇත්තේ වයස අවුරුදු 49 ක් වූ රුසියන් ජාතික පුද්ගලයෙකි.**

පොලිසිය, ප්‍රදේශ වාසීන් එක්ව අතුරුදහන්වූ අය සෙවීමේ කටයුතු වල නිරතව සිටී. අහුංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - කොස්ගම පොලිස් වසම.

2024.04.18 වන දින දහවල් කාලයේදී කොස්ගම පොලිස් වසමේ අලුත් අම්බලම බැරේගල කන්ද මාර්ගයේ ලොරි රථයක් බැරේගල කන්ද නගිමින් සිටින අවස්ථාවේදී ලොරි රථය කන්ද මැද නතරවී ඇත. රියදුරු විසින් ලොරි රථයේ ගමන් කරමින් සිටි ඔහුගේ මව, බිරිඳගේ මව, බිරිඳ හා දියණිය ලොරි රථයෙන් බස්සවා නැවත රථය පනගැන්වීමට යාමේදී ලොරි රථය පිටුපසට ගොස් මාර්ගයේ පෙරලී රියදුරු ලොරි රථයට යටවී ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ කොස්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2024.04.18 වන දින සවස් කාලයේදී වාරියපොල පොලිස් වසමේ වාරියපොල කලුගමුව මාර්ගයේ කිලෝ මීටර් 16 හා 17 කණු අතරදී වාරියපොල දෙස සිට කලුගමුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් මාර්ගය හරහා ගමන් කල යතුරුපැදියේ පැදිකාරිය බරපතල තුවාල ලබා වාරියපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 66ක් වූ කලුකාලම, බමුනාකොටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වාරියපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් තුවාල ලැබූ අනෙක් යතුරුපැදිකරු ද වාරියපොල රෝහලේ ප්‍රතිකාර ලබයි. වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - දික්වැල්ල පොලිස් වසම.

2024.04.18 වන දින සවස් කාලයේදී දික්වැල්ල පොලිස් වසමේ කෝමන්ගොඩ ප්‍රදේශයේදී තංගල්ල දෙස සිට මාතර දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව නාකුළුගමුව රෝහලට ඇතුලත් කර

වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතර මහ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ කෝමන්ගොඩ, දික්වැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසු පැදිකාරිය බතීගම රෝහලේ ප්‍රතිකාර ලබයි. දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**